සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - I | කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. සිදුහත් මහ බෝසතාණන් වහන්සේගේ පිය මහ රජතුමා වූ සුද්ධෝන රජතුමාගේ ගුරුවරයා වන්නේ,
(1) සුදත්ත ය. (2) සර්වමිත්‍ර ය. (3) කාලදේවල ය. (4) සෝණදණ්ඩ ය.

02. මඩ වගුරෙන් ඉහළට මතු වී එහි නොගැවී සිටින නෙළුම් මල් මෙන් බුද්ධාදී උතුමෝ කෙලෙස් මඩ වගුරෙන් ඉහළට නැගී එහි නොගැවී වැඩ වසති. එම ජීවිතය හඳුන්වන්නේ,
(1) පද්මාකාර ජීවිතය යනුවෙනි. (2) සරල ජීවිතය යනුවෙනි.
(3) සාමාන්‍ය ජීවිතය යනුවෙනි. (4) සංකීර්ණ ජීවිතය යනුවෙනි.

03. ''චතු අප්පමඤ්ඤා'' යනුවෙන් බුදු දහමේ දැක්වෙන්නේ,
(1) සතර සතිපට්ඨානය. (2) චතුරාර්ය සත්‍යය.
(3) සතර සංග්‍රහ වස්තුය. (4) සතර බ්‍රහ්ම විහරණය.

04. තමා විසින් පිළිපැද ඇස්පනාපිට මෙලොවදී ම ප්‍රතිඵල දැකගත හැකි බැවින් ධර්මය,
(1) ඕපනයික ය. (2) සන්දිට්ඨික ය. (3) අකාලික ය. (4) ඒහිපස්සික ය.

05. සිදුහත් බෝසතාණන් වහන්සේ ''සත්‍ය ගවේසීව'' සිටි සමයේ උන්වහන්සේට මුණ ගැසුණු සප්ත සමාපත්තිලාභී තවුසා කවුරුන් ද?
(1) භග්ගව (2) උද්දකරාමපුත්ත (3) ආලාර කාලාම (4) අසිත තවුසා

06. ''දුශ්ශීලව නොසන්සුන් සිත් ඇතිව අවුරුදු සීයක් ජීවත් වීමට වඩා සිල්වත්ව සන්සුන් සිත් ඇතිව එක් දවසක් ජීවත් වීම ශ්‍රේෂ්ඨය.'' මෙම අදහස ඇතුළත් ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
(1) යෝචේ වස්සතං ජීවේ - දුස්සීලෝ අසමාහිතෝ
(2) සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනො
(3) සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
(4) නහි වේරෙන වේරානි - සම්මන්තීධ කුදාචනං

07. තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වා ඇති දහම වන්නේ,
(1) දස රාජ ධර්ම යි. (2) පංච සීල ප්‍රතිපත්තිය යි.
(3) අත්තූපනායික ධර්ම පරියාය යි. (4) හිරි ඔත්තප්පය යි.

08. තෙරුවන් ගුණ අතරින් සද්ධර්මයේ ගුණ ගණන,
(1) විසි හතරකි. (2) හයකි. (3) නවයකි. (4) හතරකි.

09. අසාර බව අනාත්මිකර බව, තුච්ඡ බව, අර්ථ ශූන්‍ය බව දැක්වීම සඳහා බුදු දහමේ උගන්වන ධර්මතාවය,
(1) අනාත්ම යන වචනය යි. (2) අසාර්ථක යන වචනය යි.
(3) දුක්ඛ යන වචනය යි. (4) අනිත්‍ය යන වචනය යි.

10. ''රහසත් පව් නොකොට - කෙළෙසරයනුත් දුරුකොට....'' යන බුදුගුණ අලංකාරය නැමති ග්‍රන්ථයේ දී වර්ණනා කරන්නේ බුදුරජාණන් වහන්සේගේ කිනම් බුදු ගුණය ද?

(1) සුගත (2) ලෝකවිදූ (3) භගවා (4) අරහං

11. සිඟාලෝවාද සූත්‍රයේ දක්වෙන පරිදි ධනය විනාශ වීමට හේතුවන කරුණු අතරට අයත් නොවන කරුණක් වන්නේ මින් කුමක් ද?

(1) පව්ටු මිතුරන් ඇසුර (2) අනලස්ව කාලය ගත කිරීම

(3) සූදුවෙහි යෙදීම (4) මදයට හා ප්‍රමාදයට හේතුවන මද්‍යසාර ගැනීම

12. තිදොරින් කරනු ලබන අකුසල කර්ම අතර මනෝ කර්ම ගණයට අයත් නොවන්නේ,

(1) විචිකිච්ඡාව (2) මිථ්‍යා දෘෂ්ඨිය (3) අභිධ්‍යාව (4) ව්‍යාපාදය

13. බුදු දහමට අනුව හටගත් සියල්ල අනිත්‍ය ස්වරූපය දක්වීම සඳහා උපමා යොදාගෙන ඇත. ඒ අනුව ''සඤ්ඤාව'' සඳහා යොදා ඇති උපමාව වන්නේ,

(1) මායාවක් ය. (2) පෙණ පිඩක් ය. (3) කෙසෙල් කඳක් ය. (4) මිරිඟුවක් ය.

14. සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපත සිදුවූයේ,

(1) ජීවක අඹ වනයේ දී. (2) උපවත්තන සල් උයනේ දීය.

(3) ලුම්බිණි නම් සල් උයනේදී ය. (4) ඉසිපතනයේ දී ය.

15. මරණින් මතු පළමු ආත්ම භවයේ දී විපාක දෙන කර්මය වන්නේ,

(1) අහෝසි කර්මය (2) උපපජ්ජවේදනීය කර්මය

(3) දිට්ඨධම්මවේදනීය කර්මය (4) අපරාපරියවේදනීය කර්මය

16. නූපන් අකුසල් නොඉපදවීම පිණිස ද, උපන් අකුසල් දුරු කිරීම පිණිස ද, නූපන් කුසල් ඉපිදවීම පිණිස ද, උපන් කුසල් වැඩි දියුණු කිරීම පිණිස ද සතරාකාර උත්සහය විස්තර වන්නේ,

(1) සම්මා වායාමයෙ හි. (2) සම්මා සංකප්පයෙ හි.

(3) සම්මා සතියෙ හි. (4) සම්මා වාචායෙ හි.

17. ''ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල්ය. පිටත ද අවුල්ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් අවුල වෙලී සිටියි. කවරෙක් නම් අවුල් නිරවුල් කරන්නේ ද? මෙම ප්‍රශ්නයට බුදුරජාණන් වහන්සේ ලබාදුන් පිළිතුර කුමක් ද?

(1) ඉවසීමෙන් කටයුතු කළ යුතු ය. (2) ප්‍රශ්න මගහරවා ගත යුතු ය.

(3) සසර දුකින් එතෙර විය යුතු ය. (4) මතුවන ප්‍රශ්න විසඳිය යුතු ය.

18. පඤ්චස්කන්ධය යනු,

(1) රූප, වේදනා, භව, තණ්හා, උපාදාන

(2) ඇස, කන, නාසය, දිව, සම

(3) රූප, වේදනා, තණ්හා, උපාදාන, භව

(4) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ ය.

19. උපතිස්ස පිරිවැජියා ඇසූ ප්‍රශ්නයට පිළිතුර ලෙස ''යේ ධම්මා හේතුප්පභවා........'' යන ගාථාව ප්‍රකාශ කළේ,

(1) භද්දිය හිමි. (2) අස්සජි හිමි. (3) කාශ්‍යප හිමි. (4) සැරියුත් හිමි.

20. ත්‍රිවිධ රත්නය කෙරෙහි ගුණ නුවණින් දැන ඇති කරගන්නා පැහැදීම ධර්මයේ හැඳින්වෙන්නේ,

(1) භක්තිය ලෙස යි. (2) අමූලිකා ශ්‍රද්ධාව ලෙස යි.

(3) ආකාරවතී ශ්‍රද්ධාව ලෙස යි. (4) සද්දහන සද්ධා ලෙස යි.

21. දුගී පවුලක උපත ලැබුවද ඉහළ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කළ හැක්කේ,

(1) උපධි සම්පත්තියෙ නි.  (2) කාල සම්පත්තියෙ නි.

(3) ගති සම්පත්තියෙ නි.  (4) ප්‍රයෝග සම්පත්තියෙ නි.

22. බහු ජාතික බහු ආගමික සමාජයක් තුළ අන්‍ය ආගම් වලට ද ගරු කරමින් ස්වකීය අනන්‍යතාව තහවුරු වන පරිදි ජීවත් වීම,

(1) ජාත්‍යාලය නම් වේ.  (2) සමජීවිකතාව නම් වේ.

(3) සමානාත්මතාව නම් වේ.  (4) සහජීවනය නම් වේ.

23. 'පරලොවක් නැත' යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,

(1) භව තණ්හාව යි.  (2) විභව තණ්හාව යි.

(3) රස තණ්හාව යි.  (4) කාම තණ්හාව යි.

24. ජේතවනාරාමයට වැඩම කළ භික්ෂු පිරිසක් මහ ශබ්ද නගමින් උස් හඬින් කතා කරමින් සිටින විට බුදුරජාණන් වහන්සේ එම පිරිසට දේශනා කර සිටියේ,

(1) ශබ්ද නොකරන ලෙස ය.

(2) නිශ්ශබ්දතාවය උතුම් ලෙස ය.

(3) කෙවුලන්සේ ඝෝෂා නොකොට ආරාමයෙන් පිටව යන ලෙස ය.

(4) අප්‍රමාදීව කටයුතු සලසා ගන්නා ලෙස ය.

25. බුදුරජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක දී සහ ජීවක අඹ උයනේ දී දේශනා කළ යුතු ධර්ම වන්නේ,

(1) සිංසපා සූත්‍රය සහ සාමඤ්ඤඵල සූත්‍රය යි.

(2) වසල සූත්‍රය සහ වේදනාපරිග්ගහ සූත්‍රය යි.

(3) මහා සීහනාද සූත්‍රය සහ මහා මොග්ගල්ලාන සූත්‍රය යි.

(4) ධනියගෝපාල සූත්‍රය සහ කසීභාරද්වාජ සූත්‍රය යි.

26. තමන්ටත්, අනුන්ටත් හානියක් නොවන ආකාරයට සහ පංච වෙළෙඳාමෙන් තොරව ජීවත්වන ආකාරය පිළිබඳව ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ උගන්වනු ලබයි. එම ඉගැන්වීම,

(1) සම්මා දිට්ඨිය යි.  (2) සම්මා සමාධිය යි.  (3) සම්මා කම්මන්තය යි.  (4) සම්මා ආජීවය යි.

27. දුසිල්වත්ව ජීවත්වන්නාගේ මරණාසන්න මොහොත අතිශය බියකරු ය. මරණාසන්න මොහොතේ ඌරකු මෙන් කෑ ගසමින් දුක් විඳි පුද්ගලයා වන්නේ,

(1) මට්ටකුණ්ඩලී ය.  (2) සුනීත ය.  (3) චුන්ද සූකරික ය.  (4) චුන්දකර්මාර ය.

28. සතර මහා භූතයන්ට අයත් ''වායෝ'' යනු,

(1) තද ගතිය යි.  (2) සෙලවෙන ගතිය යි.  (3) ද්‍රව ගතිය යි.  (4) උෂ්ණ ගතිය යි.

29. ''ලාභෝ අලාභෝ අයසෝ යසෝච'' යන ගාථාවෙන් දක්වෙන්නේ,

(1) ලෝකාධිපති ධර්ම පිළිබඳව යි.  (2) අටලෝ දහම පිළිබඳව යි.

(3) හේතුඵල ධර්ම පිළිබඳව යි.  (4) ලෝක පාලක ධර්ම පිළිබඳව යි.

30. බුදු දහම ස්ථාපිත වීමත් සමග ලංකාවේ ඉදිකළ මුල් ම ස්තූපය වන්නේ,

(1) ථූපාරාම චෛත්‍යය යි.  (2) මහියංගන චෛත්‍යය යි.

(3) අභයගිරි චෛත්‍යය යි.  (4) කතරගම චෛත්‍යය යි.

31. ගිහියාගේ නිත්‍ය ශීලය ලෙස හඳුන්වන්නේ,

(1) දස ශීලය යි. (2) ආජීව අෂ්ටමක ශීලය යි.

(3) අෂ්ටාංග උපෝසථ ශීලය යි. (4) පංච ශීලය යි.

32. පාපමිත්‍ර සේවනය නිසා අසූ කෝටියක ධනයට උරුමකම් කියූ අවසානයේ ඉණ ඇඳි වතට පමණක් සීමාවී අපමණ දුක් වින්දේ,

(1) ඉල්ලීස සිටුපුත්‍රයා ය. (2) මහධන සිටුපුත්‍රයා ය.

(3) සුදත්ත සිටුපුත්‍රයා ය. (4) අදින්න පුබ්බක සිටුපුත්‍රයා ය.

33. ''අප්‍රියයන් හා එක්වීමටත්, ප්‍රියයන්ගෙන් වෙන්වීමටත්, කැමති දේ නොලැබීමටත් සියලු මිනිසුන්ට උරුමය'' මෙම අදහස් ප්‍රකාශ වන්නේ සිව්සස් දහම් තුළ කුමන අංගයට ද?

(1) නිරෝධ සත්‍යයට ය.

(2) දුක්ඛ සමුදය සත්‍යයට ය.

(3) දුක්ඛ සත්‍යයට ය.

(4) දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා සත්‍යයට ය.

34. යම් සේ මුල් නිරුපද්‍රිතව තිබිය දී කපන ලද ගස නැවත නැවත ලියලයි ද, එලෙසම දුක නැවත නැවත හටගනු ලබන්නේ,

(1) තණ්හාව නිසාය. (2) මෝහය (3) භය නිසාය. (4) ද්වේශය නිසාය.

35. බුදු දහමේ උගන්වන සිත කිලිටි කරන අකුසල මූලයන් වන්නේ,

(1) කාම,භව, විභව (2) සීල, සමාධි, ප්‍රඥා

(3) ලෝභ, දෝස, මෝහ (4) අලෝභ, අදෝස, අමෝහ

36. මම තරුණ වියේ දී පිළිවෙත් රැක්කේ ද නැත. ධනය රැස් කළේ ද නැත. ආදී වශයෙන් පසුතැවීමට හේතුවන බව දැක්වෙන ධම්මපද ගාථාවේ මුල් පද දෙක වනුයේ,

(1) තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති

(2) අක්කොච්ජිමං අවිධිමං - අජිනිමං අහාසි මෙ

(3) සුජීවං අහිරිකේන - කාකසුරෙන ධංසිනා

(4) අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං

37. බුදුරජාණන් වහන්සේ අප විසින් කළ යුතු දේ ද, නොකළ යුතු දේ ද උගන්වන ලදී. මෙහිදී අප විසින් නොකළ යුතු දේ හැඳින්වෙන වචනය වන්නේ,

(1) විරමණය නමිනි. (2) චාරිත්‍ර නමිනි. (3) සිරිත් නමිනි. (4) භාවනාව නමිනි.

38. මෙරට ශාසනික පුනරුදයක් ඇතිකරලීමට සහ උපසම්පදාව නැවත ස්ථාපනය කිරීමට අනුග්‍රහ දැක් වූ රාජ්‍ය පාලකයා වන්නේ,

(1) දුටුගැමුණු රජතුමා ය. (2) කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා ය.

(3) දේවානම්පියතිස්ස රජතුමා ය. (4) රාජසිංහ රජතුමා ය.

39. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියවුණේ,

(1) කුරුණෑගල යුගයේ දී ය. (2) පොළොන්නරු යුගයේ දී ය.

(3) දඹදෙණි යුගයේ දී ය. (4) අනුරාධපුර යුගයේ දී ය.

40. දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම කරවන අවස්ථාවේ ශ්‍රී ලංකාවේ පාලකයා වූයේ,

(1) පරාක්‍රමබාහු රජු ය. (2) මහසෙන් රජු ය.

(3) කිත්සිරිමෙවන් රජු ය. (4) වළගම්බා රජු ය.



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 10 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකය:

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරාගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

- අංක (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) බුදුරජාණන් වහන්සේ පස්වග තවුසන් උදෙසා දේශනා කළ සූත්‍ර ධර්මයේ නම ලියන්න.

(ii) සතර පෙර නිමිති නම් කරන්න.

(iii) ධර්ම රත්නයේ ගුණ හයකි. ඒවායින් දෙකක් ලියන්න.

(iv) පුද්ගල චරිත වර්ග අතුරින් දෙකක් නම් කරන්න.

(v) බුදු දහමේ දැක්වෙන සිරිත් හා විරිත් යන්නෙහි අදහස ලියන්න.

(vi) කයෙන් සිදුවන කුසල ධර්ම මොනවා ද?

(vii) සිව්පසය නම් කරන්න.

(viii) අනුසෝතගාමී යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි ලියා දක්වන්න.

(ix) සරණංකර සංඝරාජ හිමි විසින් රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න.

(x) සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) සිගාලෝවාද සූත්‍රයේ දී නැගෙනහිර හා දකුණු දිසාවන්ට උපමා කරුණු ලැබුවෝ කවුරුන් ද?

(ii) ඉහත දැක්වූ එක් සමාජ කණ්ඩායමකින් ඔබට විය යුතු යුතුකම් තුනක් දක්වන්න.

(iii) සිගාලෝවාද සූත්‍රයෙන් පෙන්වාදෙන යුතුකම් ඉටු කිරීම මගින් සාර්ථක ගෘහ ජීවිතයක් ගත කිරීමට හැකි වේ. පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5=10)

(03) (i) ''උට්ඨානවතෝ සතිමතෝ.......'' ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එහි අර්ථය ලියා දක්වන්න.

(iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් ලබාදෙන මග පෙන්වීම පිළිබඳ ඇගයීමට ලක් කරන්න.

(ලකුණු 2+3+5=10)

(04) (i) බුදු දහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක ලියන්න.

(ii) ඉන් එක් භාවනාවක් කෙටියෙන් හඳුන්වන්න.

(iii) ''භාවනාව අසහනකාරී සමාජය සුවපත් කරලීම සඳහා උපකාර වේ.'' විමසන්න.

(ලකුණු 2+3+5=10)

(05) (i) පරිසරය ප්‍රධාන වශයෙන් දෙයාකාරය. ඒවා නම් කරන්න.

(ii) බුදු රජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන තුනක් ලියා දක්වන්න.

(iii) ''පරිසරය සුරැකීම අප කාගෙත් යුතුකමකි.'' බුද්ධ දේශනා ද ඇතුළත් කරමින් විමසීමකට ලක් කරන්න.

(ලකුණු 2+3+5=10)

(06) (i) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට ආසන්නම හේතුව ලියන්න.

(ii) එම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ලබා ගත් තෙරුන් වහන්සේගේ නම, අනුග්‍රහය දැක්වූ රජතුමා පැවැත්වූ ස්ථානය නම් කරන්න.

(iii) ධර්මය හා විනයේ සුරක්ෂිතතාවය වෙනුවෙන් මෙම ධර්ම සංගායනාවෙන් ලැබූ මෙහෙය අගයන්න.

(ලකුණු 2+3+5=10)

(07) පහත මාතෘකා ඇසුරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා

(ii) ජනක කර්මය

(iii) බෞද්ධ ආගමික සහජීවනය

(iv) සතර සංග්‍රහවස්තු

(ලකුණු 5+5=10)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(4) | 4 -(2) | 5 -(3) | 6 -(1) | 7 -(3) | 8 -(2) | 9 -(3) | 10 -(4) |
| 11 -(2) | 12 -(1) | 13 -(4) | 14 -(3) | 15 -(2) | 16 -(1) | 17 -(3) | 18 -(4) | 19 -(2) | 20 -(3) |
| 21 -(1) | 22 -(4) | 23 -(2) | 24 -(3) | 25 -(1) | 26 -(4) | 27 -(3) | 28 -(2) | 29 -(2) | 30 -(1) |
| 31 -(4) | 32 -(2) | 33 -(3) | 34 -(1) | 35 -(3) | 36 -(4) | 37 -(1) | 38 -(2) | 39 -(1) | 40 -(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

01. i. දම්සක් පැවතුම් සූත්‍රය / ධම්මචක්ක පවත්වන සූත්‍රය

ii. ★ මහල්ලෙක් ★ ලෙඩෙක් ★ මළමිණියක් ★ පැවිදි රුවක්

iii. ★ ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ
★ සන්දිට්ඨිකෝ
★ අකාලිකෝ
★ ඒහි පස්සිකෝ
★ ඕපනයිකෝ
★ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති

iv. ★ රාග චරිතය ★ දෝස චරිත ★ මෝහ චරිතය ★ සද්ධා චරිත ★ බුද්ධි චරිත
★ විතක්ක චරිත

v. සිරිත් යනු කළ යුතු දේ හෙවත් සමාදානය.
විරිත් යනු නොකළ යුතු දේ හෙවත් විරමණය.

vi. ★ සතුන් මැරීමෙන් වැළකීම (ප්‍රාණඝාතයෙන් වැළකීම.)
★ සොරකම් කිරීමෙන් වැළකීම (අදත්තාදානයෙන් වැළැකීම.)
★ කාමයේවරදවා හැසිරීමෙන් වැළකීම. (කාම මිත්‍යාචාරයෙන් වැළකීම.)

vii. ★ චීවර ★ සේනාසන ★ පිණ්ඩපාත ★ ගිලාන ප්‍රත්‍ය

viii. ලෝකය අනුසෝතගාමී වේ. ගඟ පහළට ම ඇදී යන්නා සේ අනුව ම ගමන් කරයි. එනම් රාගයෙන් රාගයට, ද්වේෂයෙන් ද්වේෂයට මෝහයෙන් මෝහයට යාම.

ix. ★ මුණිගුණාලංකාරය ★ සාරාර්ථ සංග්‍රහය ★ රතනත්‍රය ප්‍රණාම ගාථා සන්නය.
★ සතර බණවර සන්නය

x. ★ මෙත්තා ★ කරුණා ★ මුදිතා ★ උපේක්ඛා (ලකුණු 2X10 =20)

02. i. නැගෙනහිර - මව්පියන්
දකුණු දිසාව- ගුරුවරුන්

ii. දෙමාපියන් - දරුවන් වරදින මුදවා ගැනීම.
ඔවුන් යහපත් කටයුතුවල යෙදවීම.
ඉගෙනීමේ කටයුතුවල යෙදවීම.
ගැළපෙන ආවාහ විවාහ කර දීම.
සුදුසු කල් හි සම්පත් පවරා දීම.

ගුරුවරුන්ගේ - මැනවින් හික්ම වීම. / මැනවින් ඉගැන්වීම. / දන්නා සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීම. / තම මිත්‍රයන්ට ශිෂ්‍යයා හඳුන්වා දීම./ ශිෂ්‍යයා ආරක්ෂා කර ගැනීම.

iii. බටහිර දිසාවට අයත් සමාජ කණ්ඩායම සඳහන් කර ඔවුනොවුන්ගෙන් ඉටුවන යුතුකම් හා වගකීම් ඇතුළත් කරමින් එය සාර්ථක ගෘහ ජීවිතයකට මඟ සලසන ආකාරය හා වර්තමාන සමාජයට ගළපමින් කරුණු ඉදිරිපත් කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (10 ශ්‍රේණිය පෙළ පොත 09 පාඩම)

(ලකුණු 2+3+5 = 10)

03. i. උට්ඨානවතෝ සතිමතෝ
සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්ම ජීවිනෝ
අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

ii. උත්සහවන්ත වූ , මනා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂාකාරී ව කරන හික්මීමෙන් යුත් දැහැමිව ජීවත්වන අප්‍රමාදී තැනැත්තාගේ යසය වැඩෙන්නේ ය.

Past Papers Wiki



## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

iii. පුද්ගල ජීවිතය සාර්ථකත්වයට පත් කර ගැනීම සඳහා උපදෙස් සපයන හා ප්‍රායෝගික ජීවිතය සාර්ථක කර ගැනීමට මග පෙන්වන ග්‍රන්ථයකි ධම්ම පදය. පුද්ගලයාට හොඳ නරක හඳුනා ගැනීමට උපකාර වේ. වීර්යවන්තව කටයුතු කරමින් සිතේ සන්සුන් බව ඇති කර ගැනීමටත් ජීවිතය ජය ගැනීමටත් උපදෙස් ලබා දෙයි. සරල බව ඇති කර ගනිමින් සියලු දෙනා සමඟ සහජීවනයෙන් ජීවත් වීමට හා උපයන ධනය දැහැමිව උපයා, දැහැමිව ජීවන රටාව සකස් කර ගැනීමට මග පෙන්වයි. මනාව පෞරුෂය ගොඩ නගා ගනිමින් අප්‍රමාදීව කටයුතු කර ජීවිතය සාර්ථක කර ගැනීමට මනා මග පෙන්වීමක් ධම්ම පදයෙන් ලබා දෙයි. (උදාහරණ දක්වමින් පිළිතුරු ගොඩනගා ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ සලකන්න.)

(ලකුණු 2+3+5 = 10)

04. i. සමථ හා විදර්ශනා (විපස්සනා) භාවනා.

ii.
- සමථ භාවනාව යනු යහපත් කුසල අරමුණක සිත පිහිටුවා සන්සුන් කර ගැනීමයි. '' චිත්තං සමේතීති සමථෝ'' යන දේශනා පාඨයෙන් පෙන්වා දී ඇත. සිත සන්සුන් කොට සිත දියුණු කරන බැවින් චිත්ත භාවනාව ලෙස ද සිත සමාධිගත වන නිසා සමාධි භාවනාව ලෙස ද හඳුන්වයි. කර්මස්ථාන 40 කි. නීවරණයන් යටපත් වේ. ධ්‍යාන හා අභිඥා ලැබීම සමථ භාවනාවේ ඉහළ ප්‍රතිඵලයන් ය.
- විපස්සනා හෙවත් විදර්ශනා භාවනාව තුළින් සිදු කරනුයේ විවිධාකාරයෙන් හෙවත් විශේෂකොට බැලීමයි. ජීවිතය හා ලෝකය පිළිබඳව තිලකුණු අනුව නුවණින් බලන බැවින් ත්‍රිලක්ෂණ භාවනාව ලෙස ද මෙමගින් ප්‍රඥාව පසක් වන නිසා ප්‍රඥා භාවනාව ලෙස ද හඳුන්වයි.

iii. තමන් ව පාලනය කරනු ලබන්නේ සිතයි. සිත නිවැරදි ලෙස පාලනය කර ගැනීමට නොහැකි වුවහොත් පුද්ගලයාට තම ජීවිතය යහපත් ව පවත්වාගත නොහැකිය. සමාජයේ එකිනෙකා අතර ධනය, බලය, නිලය, කුලය, ආදිය පදනම් කරගෙන විශාල තරඟකාරී බවක් ඇති වී ඇත. අසීමිත ආශාව, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය පළිගැනීම ආදි පහළ මානසිකත්වයක් හේතුවෙන් සමාජය ගැටලුකාරී අසහන තත්වයකට වැටී ඇත. එයින් මිදීමට උපකාර වන්නේ භාවනාවයි. (ආදි ලෙස උදාහරණ දක්වමින් පිළිතුර ගොඩ නඟා ඇත්නම් සාර්ථක පිළිතුරක් සේ සලකන්න.)

(ලකුණු 2+3+5 = 10)

5. i. ජීවී හා අජීවී පරිසරය

ii.

| | | |
|---|---|---|
| පළමු වන වස් කාලය | - | බරණැස ඉසිපතන මිගදාය. |
| දෙවන හා තෙවන, සිව්වන වස් කාලය | - | වේළුවනාරාමය තුළ |
| පස්වන වස්කාලය | - | විශාලා මහනුවර කූඨාගාර ලෙනෙහි |
| හයවන වස්කාලය | - | මකුල පර්වතය |
| අටවන වස්කාලය | - | භේෂකලා පර්වතයෙහි |
| දහවන වස්කාලය | - | පාරිලෙය්‍ය වනයෙහි |
| දහතුන, දහඅට, දහ නවය වස් කාලය | - | චාලිය පර්වතයෙහි වැඩ විසීම. |

iii. 16 පාඩම බුදු සිරිතයි පරිසරයයි. පිටු 88 - 93 දක්වා ඇති කරුණු ද ඇතුළත් කර ගනිමින් කරුණු ගොනුකර ඇති සාර්ථක පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 2+3+5 = 10)

6. i. සුභද්‍ර භික්ෂුවගේ නුසුදුසු ප්‍රකාශය ''ඇවැත්නි ශෝක නොවන්න. නොවැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් අප මිදුණෙමු. මෙය කැපය, මෙය අකැපය කීමට කිසිවෙක් නොමැත අපට කැමති දෙයක් කළ හැකිය.''

ii. මූලිකත්වය - මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ

අනුග්‍රහය - අජාසත්ත රජතුමා

ස්ථානය - රජගහනුවර වේභාර කඳුවැටිය පාමුල පිහිටි සප්තපර්ණි ගුහාය

iii. ධර්මය හා විනය ආරක්ෂා කිරීම සඳහා පළමු ධර්ම සංගායනාවෙන් විශාල සේවයක් සිදු විය. ධර්මය හා විනය සජ්ඣායනා කර භාණකවරුන්ට කට පාඩමින් ගෙන යාමට පැවරුණි. එහි සූත්‍ර පිටකය කොටස් 05 ට බෙදන ලදි. දීඝ නිකාය ( ආනන්ද හිමියන්ගේ ශිෂ්‍ය පරපුර) මජ්ඣිම නිකාය ( සැරියුත් හිමියන් ශිෂ්‍ය පරපුර) සංයුක්ත නිකාය (මහා කාශ්‍යප හිමිගේ ශිෂ්‍ය පරපුර) අංගුත්තර නිකාය (අනුරුද්ධ හිමිගේ ශිෂ්‍ය පරපුර) ඛුද්දක නිකාය (සියලු භික්ෂූන්ට) යනුවෙන් භාණකවරුන්ට පැවරීය. විනය පිටකය ද කොටස් 05 ට බෙදා උපාලි හිමිගේ ශිෂ්‍ය පරම්පරාවට ලබා දුනි. පාරාජිකා පාළි, පාචිත්තිය පාළි, පරිවාර පාළි, මහා වග්ග පාළි, චුල්ල වග්ග පාළි යනුවෙනි. එලෙස ම බුදු රජාණන් වහන්සේ දේශනා කළ විනය නීති වෙනස් නොකර රැක ගැනීම. සුභද්‍ර වැනි දුර්මත දාරී භික්ෂූන්ට ක්‍රියාත්මක වීමට අවස්ථාව නොදීම. බුදු දහම පිළිබඳ දුර්මත ඉවත් කරලීම ආදී දේ සිදුවිය. (මෙලෙස ගොඩ නඟන ලද පිළිතුරකට පිළිතුරු සලකා ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 2+3+5 = 10)



සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## II කොටස - පිළිතුරු ඉතිරි කොටස

07. i. දුටුගැමුණු රජතුමා

දුටුගැමුණු රජතුමා රුහුණු පෙළපතට අයත් කාවන්තිස්ස රජු හා විහාර මහා දේවියගේ වැඩිමහල් පුතුය. එතුමාගේ සහෝදරයා තිස්ස කුමාරයාය. ''මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවේ.'' යන්න දුටු ගැමුණු රජුගේ ආදර්ශ පාඨය වූ අතර රට විදේශීය පාලනයෙන් මුදාගෙන එක්සේසත් කිරීහට මුල් විය. භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් අවවාද අනුව රජ පාලන කිරීම. රුවන්වැලි සෑය, මිරිසවැටිය, ලෝවාමහාපාය වැනි පූජනීය ස්ථාන ඉදි කිරීම, කෘෂි ආර්ථිකය දියුණු කිරීම, රට ස්වයං පෝෂිත කිරීම ආදී කරුණු සහිත පිළිතුරකට (පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.)

(ලකුණු 05)

ii. ජනක කර්මය

ප්‍රති සන්ධිය ලබා දීමට ඉවහල් වන්නේ ජනක කර්මය වේ. මිය පරලොව ගිය පසු ඊළඟ භවයක උපත ලබා දීම සඳහා ජනක කර්මය මුල් වෙයි. ජනක කර්මය මුල් වෙයි. ජනක අකුසල් කර්ම නිරයන්, තිරිසන්, ප්‍රේත, අසුර යන සතර අපායන්වල ඉපදීමටත්, ජනක කුසල කර්මය සදෙව් ලොව ද මිනිස් ලොව සැප ඇති ස්ථානවල උපත ලැබීමට ඉවහල්වෙයි. කර්මය යන්න හඳුන්වා ඉහත පරිදි ජනක කර්මය පිළිබඳ තොරතුරු දක්වා ඇති පිළිතුරකට සමස්ථය සලකා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 05)

iii. බෞද්ධ ආගමික සහජීවනය

සහජීවනය නම් සාමයෙන්, සමගියෙන්, සහයෝගයෙන් ජීවත් වීමයි. එකමුතු වී කටයුතු කිරීමයි. මිනිසුන් ලෙස සියළු දෙනා එක්ව ජීවත් විය යුතුයි. බුදු දහමේ එන පංච ශීලය, සතර සංග්‍රහ වස්තු, සිව් බඹ විහරණය වැනි ඉගැන්වීම් තුළ ද ජාතික ආගමික වෙනසක් නොදක්වයි පොදු දේපල පරිහරණයේ දී, ආපදා අවස්තාවල දී එක් ව කටයුතු කළ යුතුයි. වෙනත් ආගමික සිද්ධස්ථානවලට ගරු කළ යුතුයි. ආදී ලෙස ලියා ඇති පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දීමට කටයුතු කරන්න.

(ලකුණු 05)

iv. සතර සංග්‍රහ වස්තු

සතර සංග්‍රහ වස්තු නම් දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යි. මෙහි දී දානය යනු තමා සතු දේ තම අයිතිය අත් හැර අන් අයට අයට දීමයි. අනුග්‍රහයන් ලෙස හෝ පූජාවක් ලෙස දීම සිදුකළ හැක. පුද්ගලයාගේ චරිත සංවර්ධනය කර ගැනීමටත් එකිනෙකාගේ විශ්වාසය හා ගෞරවය ගොඩ නගා ගැනීමටත් දානය උපකාර වෙයි.

ප්‍රිය වචනය යනු යහපත් වචනයයි. එනම් බොරුව, කේළම, පරුෂ වචනය, හිස් වචනය යනාදියෙන් වැළකී හැමට ම ප්‍රිය මනාප යහපත් වූ වචනය මෙයින් අර්ථවත් වේ.

අර්ථ චර්යාව යනු අන්‍යයන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීමයි. මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා යන සිව් බඹ විහරණයෙන් යුතුව ක්‍රියා කිරීමයි.

සමානාත්මතාවය යනු ජාති, ආගම් කුල ගෝත්‍ර ආදී කිසිඳු භේදයකින් තොරව හැමට ම එක හා සමානව ක්‍රියා කිරීමයි. ආදි ලෙස ලියා ඇති පිළිතුරකට, පිළිතුර සලකා ලකුණු ලබා දෙන්න.

(ලකුණු 05)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank